## සමුගත් මැරතන් කරු හා ලක්ෂ්මන් වෙනුවෙන් සන්නසේ ශෝකය

දුර දාවන ඉසව්ව ලාංකික තලයේ සිට ආසියා යුරෝපා මට්ටම් හරහා ජාත්‍යන්තර ඔලිම්පික් තරග මට්ටම දක්වා ගෙන ගිය කරු හෙවත් දුර ධාවන ශූර මැරතන් කරුනාරත්නගේ අකල් වියෝව ගැන අපේ සාතිශය සංවේගය පල කරමු. එසේම ලෝක මට්ටමේ තරග අද්දැකීම් ඇති කරු හා ඔහු සමගින් සමුගත් අති දක්ෂ ධාවන පුහුනු කරුවකු වන ලක්ෂ්මන් අල්විස් වැන්නවුන් ජීවත්ව සිටිනා තාක්කල් ඔවුන්ගේ දක්ෂතා වලින් ලාංකික ක්‍රීඩා ක්ෂෙත්‍රයට නිසි ප්‍රයෝජනයක් නොගෙන ඔවුන් කොන්කර තැබූ ක්‍රීඩා අමාත්‍යංශයටද අපේ අප්‍රසාදය මෙයින් පළකර සිටිමු.

## IPL ක්‍රිකට් තරඟ කාල සටහන

| | |
|---|---|
| May 2008 | |
| **Thu 1**<br>15:00 local, 09:30 GMT | **Deccan Chargers v Kings XI Punjab**<br>Rajiv Gandhi International Stadium, Uppal, Hyderabad |
| **Thu 1**<br>20:00 local, 14:30 GMT | **Rajasthan Royals v Kolkata Knight Riders**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Fri 2**<br>19:00 local, 13:30 GMT | **Chennai Super Kings v Delhi Daredevils**<br>MA Chidambaram Stadium, Chepauk, Chennai |
| **Sat 3**<br>15:00 local, 09:30 GMT | **Deccan Chargers v Bangalore Royal Challengers**<br>Rajiv Gandhi International Stadium, Uppal, Hyderabad |
| **Sat 3**<br>20:00 local, 14:30 GMT | **Kings XI Punjab v Kolkata Knight Riders**<br>Punjab Cricket Association Stadium, Mohali, Chandigarh |
| **Sun 4**<br>09:30 GMT | **Mumbai Indians v Delhi Daredevils**<br>Venue TBC Mumbai |
| **Sun 4**<br>20:00 local, 14:30 GMT | **Rajasthan Royals v Chennai Super Kings**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Mon 5**<br>19:00 local, 13:30 GMT | **Bangalore Royal Challengers v Kings XI Punjab**<br>M Chinnaswamy Stadium, Bangalore |
| **Tue 6**<br>19:00 local, 13:30 GMT | **Chennai Super Kings v Deccan Chargers**<br>MA Chidambaram Stadium, Chepauk, Chennai |
| **Wed 7**<br>13:30 GMT | **Mumbai Indians v Rajasthan Royals**<br>Venue TBC Mumbai |
| **Thu 8**<br>15:00 local, 09:30 GMT | **Delhi Daredevils v Chennai Super Kings**<br>Feroz Shah Kotla, Delhi |
| **Thu 8**<br>20:00 local, 14:30 GMT | **Kolkata Knight Riders v Bangalore Royal Challengers**<br>Eden Gardens, Kolkata |
| **Fri 9**<br>19:00 local, 13:30 GMT | **Rajasthan Royals v Deccan Chargers**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Sat 10**<br>15:00 local, 09:30 GMT | **Bangalore Royal Challengers v Mumbai Indians**<br>M Chinnaswamy Stadium, Bangalore |
| **Sat 10**<br>20:00 local, 14:30 GMT | **Chennai Super Kings v Kings XI Punjab**<br>MA Chidambaram Stadium, Chepauk, Chennai |
| **Sun 11**<br>15:00 local, 09:30 GMT | **Deccan Chargers v Kolkata Knight Riders**<br>Rajiv Gandhi International Stadium, Uppal, Hyderabad |
| **Sun 11**<br>20:00 local, 14:30 GMT | **Rajasthan Royals v Delhi Daredevils**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Mon 12**<br>19:00 local, 13:30 GMT | **Kings XI Punjab v Bangalore Royal Challengers**<br>Punjab Cricket Association Stadium, Mohali, Chandigarh |
| **Tue 13**<br>19:00 local, 13:30 GMT | **Kolkata Knight Riders v Delhi Daredevils**<br>Eden Gardens, Kolkata |
| **Wed 14**<br>09:30 GMT | **Mumbai Indians v Chennai Super Kings**<br>Venue TBC Mumbai |
| **Wed 14**<br>20:00 local, 14:30 GMT | **Kings XI Punjab v Rajasthan Royals**<br>Punjab Cricket Association Stadium, Mohali, Chandigarh |
| **Thu 15**<br>19:00 local, 13:30 GMT | **Delhi Daredevils v Deccan Chargers**<br>Feroz Shah Kotla, Delhi |
| **Fri 16**<br>13:30 GMT | **Mumbai Indians v Kolkata Knight Riders**<br>Venue TBC Mumbai |
| **Sat 17**<br>15:00 local, 09:30 GMT | **Delhi Daredevils v Kings XI Punjab**<br>Feroz Shah Kotla, Delhi |
| **Sat 17**<br>20:00 local, 14:30 GMT | **Rajasthan Royals v Bangalore Royal Challengers**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Sun 18**<br>15:00 local, 09:30 GMT | **Deccan Chargers v Mumbai Indians**<br>Rajiv Gandhi International Stadium, Uppal, Hyderabad |
| **Sun 18**<br>20:00 local, 14:30 GMT | **Kolkata Knight Riders v Chennai Super Kings**<br>Eden Gardens, Kolkata |
| **Mon 19**<br>19:00 local, 13:30 GMT | **Bangalore Royal Challengers v Delhi Daredevils**<br>M Chinnaswamy Stadium, Bangalore |
| **Tue 20**<br>19:00 local, 13:30 GMT | **Kolkata Knight Riders v Rajasthan Royals**<br>Eden Gardens, Kolkata |
| **Wed 21**<br>09:30 GMT | **Mumbai Indians v Kings XI Punjab**<br>Venue TBC Mumbai |
| **Wed 21**<br>20:00 local, 14:30 GMT | **Chennai Super Kings v Bangalore Royal Challengers**<br>MA Chidambaram Stadium, Chepauk, Chennai |
| **Thu 22**<br>19:00 local, 13:30 GMT | **Delhi Daredevils v Kolkata Knight Riders**<br>Feroz Shah Kotla, Delhi |
| **Fri 23**<br>19:00 local, 13:30 GMT | **Kings XI Punjab v Deccan Chargers**<br>Punjab Cricket Association Stadium, Mohali, Chandigarh |
| **Sat 24**<br>15:00 local, 09:30 GMT | **Delhi Daredevils v Mumbai Indians**<br>Feroz Shah Kotla, Delhi |
| **Sat 24**<br>20:00 local, 14:30 GMT | **Chennai Super Kings v Rajasthan Royals**<br>MA Chidambaram Stadium, Chepauk, Chennai |
| **Sun 25**<br>15:00 local, 09:30 GMT | **Bangalore Royal Challengers v Deccan Chargers**<br>M Chinnaswamy Stadium, Bangalore |
| **Sun 25**<br>20:00 local, 14:30 GMT | **Kolkata Knight Riders v Kings XI Punjab**<br>Eden Gardens, Kolkata |
| **Mon 26**<br>19:00 local, 13:30 GMT | **Rajasthan Royals v Mumbai Indians**<br>Sawai Mansingh Stadium, Jaipur |
| **Tue 27**<br>19:00 local, 13:30 GMT | **Deccan Chargers v Chennai Super Kings**<br>Rajiv Gandhi International Stadium, Uppal, Hyderabad |
| **Fri 30** | **1st Semi-Final - TBC v TBC**<br>Venue TBC Mumbai |
| **Sat 31** | **2nd Semi-Final - TBC v TBC**<br>Venue TBC Mumbai |
| June 2008 | |
| **Sun 1** | **Final - TBC v TBC**<br>Venue TBC Mumbai |

# මනි මෝනියාවට බෙහෙත - "බඩ නැගුම"



පංදුක කොහෙද මේ ගාල කඩාගෙන දුවන්නේ ඇඟ පුරාම මඩත් ගෑවිලා මොකද කරදරයක්වත්ද?

අනේ මගේ වෙලාව හොඳයි ජගිරි මහත්තයයි සංක්‍රමන මහත්තයයි දෙන්නම ඉන්නවා මම හිතුවා කාර්යාලයෙ කවුරුත් නෑ කියලා. සේරටම කලින් මම මේ දොර වහලා ඉන්නම්කො.

ඒයි දොර ඔහොම තියෙනවා පංදුක එකෙන් කවුරුවත් එන්නේ නෑ තමුසෙට ගහන්න. කියනවකො මොකද උනේ කියලා.

නෑ ජගිරි මහත්තයා මගෙත් තියෙන පංඩිත කමට මම පත්තරේට ලිව්වනේ අපේ ටීම් එකට තරුණ කොල්ලො දාන්න ඕනි එතකොට කන්ඩායමේ ජවය වැඩිවෙනවා එතකොට අපිට මීට වඩා තරඟ දිනන්න පුළුවන් අරකද මේකද කියලා.

ඉතින්,

ඉතින් තමයි ඒකට උරන වෙච්ච කොල්ලො මාව දැකල පස්සෙන් එලව එලවා ගල් ගහන්න පටන් ගත්තා. මමත් ඇරියේ නෑ පස්ස නොබලා දුන්නා හොඳ මැරතන් පාරක් ඉස්ටේසමේ ඉඳලා මෙතෙන්ටම.

මට තේරෙන්නෑ පංදුක තමුසෙ තරුණ කොල්ලො ටීම් එකට දාන්න ලියපු එකේ වැරැද්ද මොකද්ද කියලා.

ඇයි සංක්‍රමන මහත්තයෝ තරුණ කොල්ලො ටීම් එකට දාලත් වැඩක් උනේ නෑනේ. කොදෙව්වො අපිට නෙලුවනෙ දුක නැතුව. එක ටෙස්ට් මැච් එකක් නම් දිනා ගත්තා.

මේ කිරිකිට් වලින් නම් හරිම අපලයි පංදුකට. ගියපාර පැනලා කොඩිය වනන්න ගිහිල්ලා කොන්දත් කඩාගත්තා නේද. ඇත්තටම පංදුක මොකක්ද අපි මැච් පරදින්න හේතුව කියලා තමුසෙට හිතෙන්නෙ.

මම හිතන්නේ කොදෙව්වො පසුගිය අවුරුදු 15ක් විතර එක දිගටම මැච් පැරදුන හින්දා අනුකම්පා කරලා අපි ඒ ගොල්ලන්ට දිනන්න දෙන්න ඇති.

නෑ නෑ එහෙම කොහොමද එහෙම වෙන්න බෑ. අපේ අය Match Fixing වලට නෝන්ඩි වෙලා නෑ.

හොඳ වෙලාවට නෝන්ඩි වෙලා නම් නෑ තමයි. එහෙම නම් මම හිතන්නේ පුහුණුකරුගේ ගේම් ප්ලෑන් හරි නැතුව ඇති.

ඒකත් වෙන්න බෑ. මිනිහා කිරිකිට් දියුණුම රටේ ඔස්ට්‍රේලියාවේ පොරක්නෙ.

ඔස්ට්‍රේලියාවේ නම් තමයි ඒත් මිනිහව මෙහෙ නවුරුවත්ම දන්නේ නෑ. ඊටත් වඩා මිනිහගෙ පැලෑන්ස් ඔය අලුත් කට්ටියට තේරෙන්නේ නැතිව ඇති. පරණ කට්ටියට තේරෙනවනේ. ඒ ගොල්ලොත් හොර නෑනේ. සාමාන්‍යයෙන් සුද්දෙක් කිව්වම අපේ රටේ මිනිස්සු ලෙව කාගෙන බඩගාගෙන ඕනිදෙයක් කරනවනෙ.

එහෙනම් ජගරි මහත්තයා මන්ඩලේ කවල්ද දන්නෑ මන්ඩලේ කවල් නැති කාලයක් අපේ ටීම් එකේ තිබුන්නෑනේ.

මන්ඩලේ කවල් කියලා මැච් පරදිනවා කියල නම් මට හිතන්න බෑ.

නෑ මම කිවුවේ මොනවද ගෑනු කවල් වගයක් තියෙනවා කියලා රේඩියෝ එකෙන් කිව්වා.

ඇයි යෝධයෝ ගෑනු කවල් තියෙනව නම් තමයි අපේ මිනිස්සු හොඳට වැඩ පෙන්වන්නෙ. ඒ නිසා ඒක නම් කොහොමවත් වෙන්න බෑ.

අම්මපා මට නම් හිතා ගන්නවත් බෑ මොකද්ද පුරස්නෙ කියලා.

අපේ සංක්‍රමන මහත්තයට මේ ගැන මොකද්ද හිතෙන්නේ.

මටනම් හිතෙන්නේ පංදුක මේ 20 ටුවෙන්ටි වැඩේ හින්ද කට්ටිය සේරගෙම මොලේ කොලොප්පම් වෙලා ඇති.

ඒ කිවුවෙ,

ඒ කිවුවෙ කට්ටියකට හිතෙනවා ඇති මේ කිරිකට් ගහල දැන් වැඩක් නෑ 20 ටුවෙන්ටි පාරක් දාගත්තනම් ගොඩ තමයි කියලා. තවත් කට්ටියක් හිතනවා ඇති ලැබුන සල්ලි ටික ආයෝජනය කරලා වවාගන්න ක්‍රමයක්. තවත් කට්ටියක් හිතනවා ඇති අරූටනම් සල්ලි ගෝනියක් ලැබුනා අපිට සොච්චමක් වත් ලැබුන් නෑ කියලා. තවත් කට්ටියක හිතනවා ඇති දෙන ගානක් පරසිද්ද නොකර දුන්න නම් නේද හොඳ කියලා. ඔය විදියට එක එක දේ හිතල සේරගෙම මොලේ කවල් වෙලා ඇති මගේ හිතේ. අනික ඔය මුදල් බාගේ ගැන ඔය විදියට වැඩිය හිතුවම "මනිමෝනියාව" කියලා ලෙඩක් හැදෙනවලු. ඒක "නිව්මෝනියාවටත්" වඩා දරුනු එකක්ලු.

හරියට හරි සංක්‍රමන මහත්තයා ලෙඩේ ඇල්ලුවා. එකත් එකටම ඕක තමයි වෙලා ඇත්තේ. අපි මේකට මොකක්හරි පියවරක් අරගෙන අපේ කන්ඩායම කොහොමහරි බේරගන්න ඕනි.

මොකද මේ ගමනත් ජනාධිපතිතුමාට පෙත්සමක් ගහන්නද කල්පනාව. නෑ නෑ ජගරි මහත්තයො අපේ ටීම් එකට මොලේ විරේකයක් දෙන්න ඕනි.

කොහොමද ඒක කරන්නේ මම හිතන්නෑ ඒක ලේසි වැඩක් කියලා. මොලේ විරේකයක් දෙන්න පුළුවන් මානසික රෝහලකටම තමයි.

එහෙමනම් ජගරි මහත්තය මම කලින් කියපු විදිහට ඒ වැඩෙන් ජනපති තුමාට බාරදෙමු. මොකද සිරිලංකාවේ ජනාධිපති පදවියට කරන්න බැරි දෙයක් නෑනෙ.

ඇයි පංදුක එතුමන්ට රටේ තියෙන පුරස්න මදිවටද ? එහෙම කියන්න එපා සංක්‍රමන මහත්තයො කිරිකට් කියන්නෙත් රටේ පුරස්නයක් තමයි. එතුමාට කරන්න තියන්නෙ සියලුම කිරිකට් ක්‍රීඩකයො ජනාධිපති මැදුරට ගෙන්නල හොඳට බටර් දාලා කොත්තු රොටි පාරකුත් එක්ක චීන ආහාර වේලක් සපයලා යෝජනාව ඉදිරිපත් කරන එකයි.

මොන යෝජනාවක්ද බං

ඔය ක්‍රීඩකයන්ට කිරිකට් මගින් ඕනෑවට වැඩිය ලැබෙන මුදල් සේරම එකතු කරල පදනමක් දාලා ඒකෙන් රටට සේවයක් කරන්න.

අදහසනම් නරක නෑ පංදුක.

මම තව ටිකක් පැහැදිලි කරන්නම්කො අද රටේ ලොකු මුදල් අර්බුදයක් තියෙනවනෙ සමහර තැන්වල මිනිසුන්ගෙ පඩි නඩි ගෙවන්නත් ආන්ඩුවට සල්ලි නැතිලු.. ඒ වගේ බඩට වැදිච්ච අය සෑහෙන ප්‍රමානයක් රටේ ඉන්නවනේ. ඒ මිනිස්සුන්ට කෑම වේලක් සතියකට වරක්වත් දෙන්න බලාගෙන අලුත්ම ව්‍යාපාරය "බඩ නැගුම" කියලා කිරිකට් ක්‍රීඩකයන්ගෙ මුදල්වලින් පිහිටුවා ගත්තනම් රටටත් සේවයක් වෙන ගමන්ම ක්‍රීඩකයන්ට මනි මෝනියා රෝග යෙන් වලක්වා ගන්නත් පුලුවන්. තමන්ගෙ මුදලින් මිනිහෙක් සතියකට වේලක්වත් කාලා ඉන්නවා කියලා දැනුනම මනසට එහෙම නැත්නම් මොලේට නිකම්ම විරේකයක් ලැබෙනවා.

කියලා වැඩක් නෑ පංදුක අදහස නම් පංකාදුයි. ජනාධිපතිතුමාගෙ "මග නැගුම" "ගම නැගුම" වගේ සංකල්ප අතරට නවතම සංකල්පය "බඩ නැගුමත්" එක්කරන මෙන් අපි හැමෝම එකතුවෙලා එතුමාට ආයාචනයක් ඉදිරිපත් කරමු.

පංදුක බිලිංකම